# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 ඔක්තෝබර් මස 07 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.43 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
ඇන්ටනී උපුල් රාජිත
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
උදාර රත්නායක
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එස්.එම්. මරික්කාර්
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඩුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මනෝ ගනේෂන්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සුනිල් ජයමිණි
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ආනන්ද රංජිත් රූපසිංහ
උදේන විජේරත්න
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
චන්දන ජයකොඩි
නිමල් ආර්. පීරිස්
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
මහින්ද ජයසිංහ
මෙරිල් පෙරේරා
ලයනල් ජයසිංහ
ලලිත් වනිගරත්න
විජිත් ප්‍රියන්ත
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් වටගල
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. නිවේදන

*I*

*"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමා වෙනුවට, 2014.10.01 දින සිට යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාවද,*

*"විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජල පවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.10.01 දින සිට ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමාව ද නම් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*II*

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.10.07 දින සිට ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාව නම් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*III*

*මෙම පළාත් සභාවේ කටයුතු දැක බලා ගැනීම සඳහා උතුරු පළාත් සභාවේ ගරු සභාපති සී.වී.කේ. සිවඥානම් මැතිතුමා අද මෙහි පැමිණ ඇති අතර, එතුමා අමුත්තන්ගේ ගැලරියේ අසුන්ගෙන ඇති බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

*IV*

*අද දින සභාගත කරන ලද නිල (හැන්සාඩ්) වාර්තාවේ මුල් පිටුවේ සඳහන්ව ඇති 2014 සැප්තැම්බර් 09 යන දිනය හා කලාප අංක 10 යන්න සහ පැති පිටුවල ඉහළින් සඳහන් එකී දිනයම 2014 සැප්තැම්බර් 23 හා 11 වන කලාපය, යනුවෙන් නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2014.09.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. බස්නාහිර පළාත් මහ නගර සභා නගරාධිපතිවරුන්ට උප නගරාධිපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ නියෝග :

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් මහ නගර සභා නගරාධිපතිවරුන්ට උප නගරාධිපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ නියෝගයන්" අනුමත කළ යුතුය යනුවෙන් උදය ගම්මන්පිල*

ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] *ඉදිරිපත් කරන ලද යෝජනාව[1]* සභා සම්මත විය.

## 04. බස්නාහිර පළාත් නගර සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති :

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් නගර සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීතීන්" අනුමත කළ යුතුය යනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින්* [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] *ඉදිරිපත් කරන ලද යෝජනාව[2]* සභා සම්මත විය.

## 05. බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති :

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 දරන හා 2014.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද "බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ට උප සභාපතිවරුන්ට හා සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීතීන්" අනුමත කළ යුතුය යනුවෙන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා විසින්* [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] *ඉදිරිපත් කරන ලද යෝජනාව[3]* සභා සම්මත විය.

***පූ.භා. 10.20 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.15 ට යළිත් රැස්විය.***

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : අති භයානක ලෙස වර්ධනය වී ඇති මත් ද්‍රව්‍ය උවදුර රටින් තුරන් කිරීමට විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස රජයට යෝජනා කිරීම.

හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*" ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස පත්ව ඇති බවට පොලිස් වාර්තාවලින් හෙළි වන බව මාධ්‍ය තුළින් වාර්තා වී ඇත.*

*ලෝකයේ යහ පැවැත්මට බරපතළ තර්ජනයක් වූ, මත්ද්‍රව්‍ය දිවයිනේ අස්සක් මුල්ලක් නොහැර සීඝ්‍ර ලෙස පැතිර ඇති අතර, පාසල් දරුවන් ඇතුළු තරුණ පරපුර දිනෙන් දින මීට ඇබ්බැහි වෙමින් පවතී. මෙහිදී බරපතළ අවදානමකට ලක්ව ඇත්තේ බස්නාහිර පළාතේ ළමා හා තරුණ පරපුරයි.*

*දකුණු ආසියාවේ විශාලතම මත්කුඩු තොග ශ්‍රී ලංකාවේදී අත්අඩංගුවට ගත්තද, ඒ පිළිබඳව විධිමත් නීතිමය ක්‍රියාමාර්ගයක් නොගැනීම මෙන්ම වරාය තුළදී බහාලුම් නිසි පරීක්ෂාවකින් තොරව මුදා හැරීම ද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට විශාල අනුබලයක් වී ඇත.*

---

[1] 2014.10.07 නිල වාර්තාව බලන්න.
[2] 2014.10.07 නිල වාර්තාව බලන්න.
[3] 2014.10.07 නිල වාර්තාව බලන්න.

*මෙම සියලු තත්ත්වයන්ට රජය වගකිව යුතු අතර, උදාසීන බවින් මිදී දිවයිනේ අති භයානක ලෙස වර්ධනය වී ඇති මත්ද්‍රව්‍ය උවදුර මෙරටින් තුරන් කරලීම සඳහා විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

පූ.භා. 11.39 ට ගරු සභාපතිතුමා **[**සුනිල් විජේරත්න මහතා**]** මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා **[**යසපාල කෝරළගේ මහතා**]** මූලාසනාරූඪ විය.

## 07. රීති අංක 30 යටතේ යෝජනාව :

ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, **"***අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තුරු ප.ව. 2.00 දක්වා සභාවේ කාලය දීර්ඝ කළ යුතු යැයි***"** යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. කල් තැබීම :

එකල්හි වේලාව අ.භා. 2.00 වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.00 ට, 2014 ඔක්තෝබර් මස 21 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.10.07
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අව/07
Minuts 2014.10.07 - Hansard Section